පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

பாராளுமன்ற அலுவல்கள் அமைச்சு

MINISTRY OF PARLIAMENTARY AFFAIRS

# වාර්ෂික කාර්ය සාධන වාර්තාව
# வருடாந்த செயலாற்றுகை அறிக்கை
# ANNUAL PERFORMANCE REPORT

# 2013

අංක 464 බී, පන්නිපිටිය පාර, පැලවත්ත, බත්තරමුල්ල.
464பி, பன்னிப்பிட்டிய வீதி, பெலவத்தை, பத்தரமுல்ல.
No. 464 B, Pannipitiya Road, Pelawatta, Battaramulla.



**මහින්ද චින්තනයෙන් බිදක්...............**

රජයේ දිගු කාලීන දැක්ම වන්නේ ආර්ථික අරමුණු ළඟාකරගැනීම, සමාජ සාධාරණත්වය සහතික කරලීම සහ සමාජ ආර්ථික ස්ථායිතාවය ඇති කිරීම සඳහා උපකාරිවන ඵලදායි, සේවා ලාභි සුහදතාවයකින් යුත්, දූෂණයෙන් තොර විනිවිද භාවයෙන් සහ වගකීමෙන් යුත් රාජ්‍ය සේවයක් ස්ථාපනය කිරීමයි.

**மஹிந்த சிந்தனையிலிருந்து ஒரு துளி**

அரசாங்கத்தின் நீண்டகால நோக்கம் யாதெனில் பொருளாதாரக் குறிக்கோள்களை அடைவதும் சமூகத்தில் நியாயத்தை நிலைநாட்டுவதும் சமூகப் பொருளாதாரத்தில் ஸ்தீரத்தன்மையினை ஏற்படுத்தும் வகையில் வினைத்திறனுடைய சேவையை வழங்கும் மனோபாவம் நிறைந்த நியாயமானதும் தெளிவானதுமான பொறுப்புடைய அரசாங்க சேவையை நிலைநாட்டுவதும் ஆகும்.

A thought from “Mahinda Chinthanaya” Concept

Establishing of a people friendly and productive public service free form corruption assuring accountability towards social economic sustainability and social equity ensuring achievement of economic objectives is the long term vision of the government.

# පටුන


01. ගරු අමාත්‍යතුමියගේ පණිවුඩය 01

02. ලේකම්තුමියගේ පණිවුඩය 02

03. පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය 03

04. හැඳින්වීම 05

05. මන්ත්‍රී කාර්ය මණ්ඩල අංශය 07

06. මන්ත්‍රී සේවා සැපයීම් අංශය 10

07. මූල්‍ය අංශය 12

08. පාලන අංශය 15

09. පරිගණක අංශය 16

10. අභ්‍යන්තර විගණන අංශය 20

11. ගරු ඇමතිතුමියගේ කාර්ය මණ්ඩලය 21

12. පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය 22

13. දෙමළ පරිවර්තනය 24

14. ඉංග්‍රීසි පරිවර්තනය 50

15. ඇමුණුම් 73

සංවිධාන ව්‍යුහය

ගරු පර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල පුහුණුව ආවරණය කළ දිස්ත්‍රික්ක

විශේෂ අවස්ථා

## ගරු අමාත්‍යතුමියගේ පණිවුඩය



2013 වර්ෂය වෙනුවෙන්, ප්‍රකාශයට පත්කරනු ලබන කාර්ය සාධන වාර්තාව පිළිබඳව පාර්ලිමේන්තු කටයුතු විෂයය භාර අමාත්‍යවරිය ලෙස සුභ පැතුම් පණිවුඩයක් නිකුත් කරනුයේ හදපිරි සතුටිනි.

පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ විෂයය පථයට අයත් කාර්යයන් හා කර්තව්‍යයන් වන පාර්ලිමේන්තුවට සහ පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කටයුතු වලට අදාළව රජය විසින් ඉටු කළ යුතු කාර්යයන්, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩල වලට සම්බන්ධ ආයතනික කටයුතු සහ හිටපු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හා ඔවුන්ගේ පවුල් වල සුභ සාධන කටයුතු වලට අදාළව මූලික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමත් ඒවා පක්ෂ භේදයකින් තොරව ක්‍රියාත්මක කිරීමටත් මාගේ අමාත්‍යාංශය බැඳී සිටී.

අතිගරු ජනාධිපතිතුමා දෙවන වරට ඉදිරිපත් කළ "මහින්ද චින්තන ඉදිරි දැක්ම" සාක්ෂාත් කරලීම උදෙසා පියවර ගැනීම ද අප සතු ප්‍රධාන වගකීමකි. ඒ සඳහා ජනතා මෙහෙවරට කැප වී සිටින ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සහ එම කාර්ය මණ්ඩල වල දැනුම, ආකල්ප හා කුසලතා වර්ධනය කරමින් කටයුතු කිරීමට අමාත්‍යාංශය නිරතුරුව සූදානම් වී සිටී.

පාර්ලිමේන්තු ක්‍රමය, ඊට අදාළව රජයේ ප්‍රතිපත්ති සහ පාර්ලිමේන්තු අණපනත් පිළිබඳව රාජ්‍ය නිලධාරීන් සහ ගරු මන්ත්‍රී කාර්ය මණ්ඩල දැනුවත් කරමින් සිටින අතර ඉදිරි වර්ෂයේදී ද පාර්ලිමේන්තු ප්‍රජාතන්ත්‍රවාදය සහ යහපාලනය ශක්තිමත් කිරීම උදෙසා ප්‍රජා මූලික මට්ටමින් ජනතාව දැනුවත් කිරීමට ද සැලසුම් සකස් කර ඇති බව ද පවසනුයේ ඉමහත් සතුටිනි.

2013 වර්ෂයේ කාර්ය සාධන වාර්තාව එළි දැක්වීමට කටයුතු කළ අමාත්‍යාංශයේ ලේකම් ඇතුළු කාර්ය මණ්ඩලයටත් මාගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයටත් මාගේ කෘතඥතාවය පිරිනමමි.

සුමේධා ජී. ජයසේන.
පාර්ලිමේන්තු කටයුතු අමාත්‍ය.

## ලේකම්තුමියගේ පණිවුඩය



පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ සමස්ත කාර්ය මණ්ඩලයේ සාධනීය ආකල්පයෙන් අභිප්‍රේරිත සේවා කැපවීමේ ප්‍රතිඵල රැගත් 2013 වාර්ෂික කාර්ය සාධන වාර්තාවට මෙම අදහස් මුසු කරන්නේ ඉමහත් සතුටෙනි.

වරින් වර හඳුනා ගන්නා සේවා අවශ්‍යතා, නව ප්‍රවේශයන් ඔස්සේ සේවාලාභී තෘප්තිය සැලසෙන අයුරින් ක්‍රියාත්මක කිරීමට අප පියවර ගෙන ඇත.

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ භෞතික හා සේවා අවශ්‍යතා සපුරාලීම සහ ඔවුන්ගේ කාර්ය මණ්ඩල වෙනුවෙන් නියමිත සේවා ඉලක්ක සපුරාලීම පිළිබඳ තොරතුරු මෙම වාර්තාවෙහි අඩංගු වේ.

මන්ත්‍රී කාර්ය මණ්ඩලයෙන් අපේක්ෂිත සේවය සැලසීමට අවශ්‍ය ධාරිතා වර්ධනය කිරීමට අදාළ පුහුණු හා දැනුවත් කිරීම් පිළිබඳව අප ප්‍රශංසා මුලික ඇගයීමට ලක්වී ඇත. රජයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන්ගේ දැනුම යාවත්කාලීන කරමින් ගැටළු හා දැනුම හුවමාරු කරගැනීමට අවස්ථා සැලසූ වැඩසටහන් පිළිබඳව ද එවැනිම ඇගයීම් සිදුවී ඇත.

තව ද යහපාලනය තේමාව කරගත් ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කරමින් රට තුළ ඒ පිළිබඳ දැනුවත්භාවයක් ගොඩනැංවීම විශේෂ වැදගත්කමකින් යුතු කාර්යයක් ලෙසින් ප්‍රශංසාවට ලක්වෙමින් පවතී. එම ග්‍රන්ථය දෙමළ භාෂාවට පරිවර්තනය කොට දෙමළ ජනතාවගේ පරිශීලනය සඳහා අවස්ථාව සැලසීමෙන් රජයේ භාෂා ප්‍රතිපත්තියට ශක්තිමත් දයකත්වයක් ලබාදීමට හැකිවූ බව සඳහන් කරමු.

අමාත්‍යාංශය මගින් ක්‍රියාත්මක දැනුවත් කිරීම් වැඩසටහන් ඔස්සේ මානව සම්පත සංවර්ධනය පිළිබඳව ග්‍රන්ථයක් ප්‍රකාශයට පත් කිරීම සඳහා පදනම වැටෙන්නේ ද 2013 වසරේ වන අතර, එය 2014 වසරෙහි එළිදැක්වීමට නියමිතය.

දිනෙන් දින වර්ධනය වන ගුණාත්මක මානව සම්පතක අප්‍රතිහත ධෛර්යය තුළින් ඉදිරි වසරේදී අපගේ කාර්ය සාධනය වඩාත් උසස් තලයකට පමුණුවාලීම අපගේ ඒකායන අභිප්‍රායයි. ඒ සඳහා අවශ්‍ය ශක්තිය හා ධෛර්යය සැමටම ලැබේවායි ප්‍රාර්ථනය කරමි.

ගතවූ වසරෙහි ප්‍රගතියට උරදුන් සමස්ත කාර්ය මණ්ඩලයට මාගේ ස්තූතිය පිරිනමන අතර ගරු අමාත්‍යතුමියගෙන් ලද සහයෝගය හා මඟපෙන්වීම ද බෙහෙවින් අගය කරමි.

ප්‍රින්සි ජයතුංග
ලේකම්.

## පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය

**කාර්යාලය පිහිටීම**

බත්තරමුල්ල, පැලවත්ත, පන්නිපිටිය පාර, 464 බී දරණ ස්ථානයේ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය පිහිටා ඇත.

දුරකථන අංක - 0112786988, 0112177057

ෆැක්ස් අංකය - 0112786968

විද්‍යුත් ලිපිනය - mdpa@sltnet.lk

වෙබ් අඩවිය - www.minparliament.gov.lk

**දැක්ම**

කාර්යක්ෂම හා සඵලදායී මහජන සේවාවක් උදෙසා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සවිමත් කිරීම.

**මෙහෙවර**

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගෙන් අපේක්ෂිත මහජන සේවය ප්‍රශස්ත මට්ටමකින් සැලසීම සඳහා වන උපස්ථම්භක සේවා සැපයීම.

**ක්‍රියාකාරකම්**

- **අවශ්‍ය මානව සම්පත් සම්පාදනය.**
  - ➢ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල පත් කිරීම.
  - ➢ අවශ්‍යතා පරිදි කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීම.

- **නිපුණතා සපිරි කාර්ය මණ්ඩලයක් ලබා දීම.**
  - ➢ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල සහ අනෙකුත් අදාළ රාජ්‍ය නිලධාරීන් සඳහා දැනුවත් කිරීම් හා පුහුණු වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.

- **මූල්‍ය සම්පත් සම්පාදනය**
  - ➢ ගරු පාර්ලිමේන්තු කාර්ය මණ්ඩල සඳහා වැටුප් ගෙවීම.
  - ➢ සේවය අවසන් වූ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල සඳහා පාරිතෝෂික දීමනා ගෙවීම.

- **භෞතික සම්පත් හා සේවා පහසුකම් සැලසීම.**
    - ➢ කාර්යාල උපකරණ හා සන්නිවේදන උපකරණ සැපයීම.
    - ➢ තීරුබදු රහිත වාහන ආනයන බලපත්‍ර ලබා දීම.
    - ➢ ගරු මන්ත්‍රීවරුන් සඳහා සමූහ රක්ෂණ ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

- **ප්‍රතිපත්ති සම්පාදනය.**
    - ➢ අවශ්‍ය අමාත්‍ය මණ්ඩල සංදේශ ඉදිරිපත් කොට ප්‍රතිපත්තිමය තීරණ ලබා ගැනීම.
    - ➢ ප්‍රතිපත්තිමය තීරණ ක්‍රියාවට නැංවීම.

- **අදාළ පාර්ශව සම්බන්ධීකරණය තුළින් සංවර්ධන ක්‍රියාදමයට දයක වීම.**
    - ➢ අදාළ ආයතන සම්බන්ධීකරණය තුළින් පාර්ලිමේන්තු මන්ත්‍රී කොට්ඨාශ තුළ හඳුනා ගත් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.
    - ➢ දැයට කිරුළ, දිවි නැගුම ආදී රජයේ සංවර්ධන වැඩසටහන් වලට දයකත්වය සැපයීම.

## හැඳින්වීම

"PARLIAMENT" යන්න "PARLE"යන ප්‍රංශ වචනයෙන් උපත ලැබූවකි. එහි අරුත "සාකච්ඡා කිරීම" යන්නයි.

රටක ජනතාව පාලනය කිරීම සඳහාත්, ඔවුන්ගේ අවශ්‍යතා ක්‍රමවත්ව ඉටු කිරීම සඳහාත්, යම් විධිමත් නීති පද්ධතියක් සකස් විය යුතුය. මෙම කාර්යය ඉටු කිරීම සඳහා ජනතාවගේ සෘජු මැදිහත් වීම ප්‍රායෝගික නොවන නිසා තම නියෝජිතයන්ගෙන් සැදුම් ලත් කණ්ඩායමක් මගින් මෙය ඉටු කිරීම ප්‍රජාතන්ත්‍රවාදී රටක පවතින සම්ප්‍රදායයි.

පුළුල් වශයෙන් ගතහොත් රටක නීති පද්ධතිය සකස් කිරීමටත් මහජන අවශ්‍යතා අනුව ඒවා සංශෝධනය කිරීමටත් ජනතාව විසින් ඡන්දයෙන් තෝරා පත් කර ගන්නා කණ්ඩායමක් වශයෙන් අර්ථ නිරූපණය කෙරේ. විවිධ නම් වලින් හැඳින්වූවත් ව්‍යවස්ථාදායකය පිළිබඳව ප්‍රජාතන්ත්‍රවාදී රටවල දක්නට ලැබෙන්නේ මෙම මූලික සංකල්පය යි.

ඈත අතීතයේදී බොහෝ රටවල විවිධ කාල වකවානුවල දී සාකච්ඡා කොට සම්මුතියෙන් තීරණවලට එළඹීමේ පිළිවෙත දක්නට ලැබිණි. ලංකාවේත් මෙවැනි පාලන ක්‍රමයක් පැවති බවට පැහැදිලි සාක්ෂි දක්නට ලැබේ. උදාහරණයක් ලෙස පොළොන්නරු යුගයේ දී ඉදි කෙරුණු "නිශ්ශංක ලතා මණ්ඩපය" රජතුමා සහ ඇමති මණ්ඩලයේ සාකච්ඡා සම්මුතීන් වෙනුවෙන් නිර්මාණය වූවකි. එහිදී වඩාත් ජ්‍යෙෂ්ඨ අමාත්‍යවරුන් වෙනුවෙන් රජතුමාට ආසන්නයේ ඉදිරිපෙළ අසුන් පනවා තිබූ බවත් සෙසු අමාත්‍යවරුන්ට පසුපසට වන්නට අසුන් පනවා තිබූ බවත් සඳහන් වේ. ඒ සඳහා පැහැදිලි ගොඩනැගිලි සැලැස්මක් ද දක්නට ලැබිණි. තවත් පැහැදිලි නිදර්ශනයක් නම් මහනුවර "මඟුල් මඩුව" යි. ලෝක ඉතිහාසය දෙස බලන කල පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයේ "මව" වශයෙන් සැලකෙන බ්‍රිතාන්‍ය පාර්ලිමේන්තුවට දීර්ඝ ඉතිහාසයක් ඇති අතර ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තු ක්‍රමයේ විකාශනයට ද එමගින් ආභාෂය ලැබී ඇති බව ඓතිහාසික තොරතුරු අධ්‍යයනය කිරීමේදී පැහැදිලි වේ.

වර්තමානයේ පාර්ලිමේන්තුව නීතිරීති පැනවීම මෙන්ම මූල්‍ය කළමනාකරණ වගකීම් භාරය ද දරන උත්තරීතර ආයතනය හැටියට සැලකේ. ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුව වනාහි උත්තරීතර සහ ස්වෛරී ව්‍යවස්ථාදායකය යි.

1931 දී ඩොනමෝර් ව්‍යවස්ථාව මගින් සර්වජන ඡන්ද බලය හා විධායක කාරක සභා ක්‍රමය හඳුන්වා දීම ව්‍යවස්ථා වර්ධන ඉතිහාසයේ සන්ධිස්ථානයක් සනිටුහන් කරයි. 1948 දී ශ්‍රී ලංකාව නිදහස ලැබීමත් සමග "වෙස්මිනිස්ටර්" ක්‍රමයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ඇති කර ගනු ලැබිණි. පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමය පැහැදිලිව දක්නට ලැබෙන්නේ එතැන් පටන්ය. 1972 වසරේදී ජනරජයක් බවට පත් කිරීමත් සමග ශ්‍රී ලංකාව ඩොමිනියන් තත්ත්වයෙන් මිදුණු අතර, ඒ අනුව සෙනෙට් සභාවත්, අග්‍රාණ්ඩුකාර ධූරයත් ඉවත් කර ඒ වෙනුවට නාමික ජනාධිපති ධූරය හඳුන්වා

දෙනු ලැබිණි. 1978 දී සම්මත කළ නව ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මගින් එම ජනාධිපති ධූරය විධායක බලතල සහිත ධූරයක් බවට පත් කෙරුණි.

"කාර්යක්ෂම සඵලදායී මහජන සේවාවක් උදෙසා ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සවිමත් කිරීමේ" අරමුණින් 1970 දී ආරම්භ කරන ලද පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය නිහඬ මහජන සේවයක් ඉටු කරන අමාත්‍යාංශයකි.

ගරු කේ.බී.රත්නායක මැතිතුමා, ක්‍රීඩා හා පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යවරයා ලෙස, මෙම අමාත්‍යාංශය භාර පළමු අමාත්‍යවරයා වශයෙන් (1970-1977) කටයුතු කළේය. පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශ ඉතිහාසයේ දීර්ඝතම කාලයක් අමාත්‍ය ධූරය හොබවන ලද ගරු වින්ස්ටන් පෙරේරා අමාත්‍යතුමා 1977 සිට 1990 දක්වා ක්‍රීඩා/අධිකරණ/පරිසර යන අංශයන් හා ඒකාබද්ධව කටයුතු කරන ලද්දේ මෙම අමාත්‍යාංශය වඩාත් ශක්තිමත් ආයතනයක් බවට පත් කරමිනි. ගරු ආචාර්ය විමල් වික්‍රමසිංහ මැතිතුමා (1993-1994) පරිසර අමාත්‍යාංශය සමඟද ගරු රත්නසිරි වික්‍රමනායක මැතිතුමා විසින් (1994-1997) රාජ්‍ය පරිපාලන/වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය සමඟ ද ගරු ජෙයරාජ් ප්‍රනාන්දු පුල්ලේ මැතිතුමා විසින් (1997-2000) සැලසුම් ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යාංශය සමඟ ද ගරු එස්.බී.දිසානායක මැතිතුමා විසින් සමෘද්ධි, ග්‍රාමීය කටයුතු හා උඩරට සංවර්ධන අමාත්‍යාංශ සමඟ ද ගරු මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා විසින් (2001) මහවැලි සංවර්ධන අමාත්‍යාංශය සමඟ ද ඒකාබද්ධව පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය ක්‍රියාත්මක කරවූයේ ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් උපරිම සේවාවන් ලබා දෙමිනි.

පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශ ඉතිහාසයේ සුවිශේෂී සන්ධිස්ථානයක් සනිටුහන් කරමින් 2001.12.12 දින ගරු ඒ.එච්.එම්.අස්වර් මැතිතුමා යටතේ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය වෙනම අමාත්‍යාංශයක් බවට පත් විය. පසුව ගරු මිල්රෝයි ප්‍රනාන්දු මැතිතුමා යටතේ ද (2004-2005), ගරු මහාචාර්ය විශ්වා වර්ණපාල මැතිතුමා යටතේ ද (2006-2007), අල්හාජ් එම්.එච්. මොහොමඩ් අමාත්‍යතුමා යටතේ ද (2007-2010) පරිපාලනය වූ මෙම අමාත්‍යාංශය 2010 වසරේ සිට ගරු සුමේධා ජී. ජයසේන අමාත්‍යතුමිය යටතේ ක්‍රියාත්මක වනුයේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් උදෙසා වඩාත් පුළුල් වූද කාර්යක්ෂම හා ඵලදායී වූද සේවාවන් රැසක් ලබා දෙමිනි.

මෙහිදී මන්ත්‍රී කාර්ය මණ්ඩල පත් කිරීම හා ඔවුනට වැටුප් හා පාරිතෝෂික ලබා දීමෙන් ද ගරු මන්ත්‍රීවරුන් සඳහා තීරු බදු රහිත වාහන ආනයන බලපත්‍ර ලබා දෙමින් ද, ගරු මන්ත්‍රීවරුන් රක්ෂණය කරමින් ඔවුන් සඳහා වෛද්‍ය හා හදිසි අනතුරු පාරිතෝෂික ප්‍රතිලාභ ලබා දෙමින් ද විශේෂයෙන්ම ගරු මන්ත්‍රීවරුන්ගේ කාර්ය මණ්ඩල පුහුණු කිරීම ආදී සේවාවන් සැපයීම මගින් ද ගරු මන්ත්‍රීවරුන් වෙත උපරිම සේවාවක් සැපයීමේ අවස්ථාව ලැබී ඇත. 2013 වර්ෂයට අදාළව අප අමාත්‍යාංශය මගින් සිදුකරන ලද සේවාවන් මෙම කාර්ය සාධන වාර්තාව මගින් ඉදිරිපත් කෙරේ.

## මන්ත්‍රී කාර්ය මණ්ඩල අංශය

මන්ත්‍රී කාර්ය මණ්ඩල වලට අදළ ආයතන කටයුතු ඉටු කිරීම මෙම අංශයට පැවරේ.

ගරු මන්ත්‍රීවරුන්ගේ නිර්දේශ මත මෙම කාර්ය මණ්ඩල පත් කරනු ලබයි. එසේ පත් කරනු ලබන කාර්ය මණ්ඩල තනතුරු පහත පරිදිවේ.

01. ලේකම්

02. යතුරු ලේඛක

03. කාර්යාල කාර්ය සහයක

04. රියැදුරු

05. පර්යේෂණ සහකාර

මේ සඳහා රැකියා විරහිත උපාධිධාරියකු පත්කිරීම හෝ
රාජ්‍ය සේවයේ නියුතු උපාධිධාරීන් අතරින් අයෙකු තෝරා පත්කර ගැනීමේ හැකියාව ඇත.

අංශය මගින් ඉටු කරනු ලබන කාර්යයන් පහත සඳහන් වේ.

- ගරු මන්ත්‍රීවරයාගේ නිර්දේශය මත මන්ත්‍රී කාර්ය මණ්ඩල පත්කිරීම් මෙන්ම සේවය අවසන් කිරීම.
- රාජ්‍ය සේවයේ නියුතු අයෙක් නම් එම සේවයෙන් නිදහස් කරවා ගැනීම, නිත්‍ය සේවා ස්ථාන වෙත නැවත අනුයුක්ත කිරීම.
- මන්ත්‍රී කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම සඳහා ගිණුම් අංශයට අවශ්‍ය දත්ත ලබා දීම.
- වැටුප් ප්‍රතිපූර්ණයට අදළ වවුචර් සකස් කිරීම.
- කාර්ය සාධන ඇගයීම් කටයුතු
- පෞද්ගලික කාර්ය මණ්ඩලයට හැඳුනුම්පත් ලබා දීම.
- සුදුසුකම් ලාභීන්ට පාරිතෝෂික දීමනා ගෙවීමට අදළ වවුචර් පත් සකස් කිරීම.
- උත්සව අත්තිකාරම් ලබාදීමට වවුචර් පත් සකස් කිරීම.
- ගමන් වියදම් වවුචර් පත් සකස් කිරීම.

**2013 වසර තුළ මන්ත්‍රී කාර්ය මණ්ඩල පත්කිරීම් හා සේවය අවසන් කිරීම්**

| තනතුර | 2013 | | |
|---|---|---|---|
| | පත්වීම් | අවසන් කිරීම | සේවයේ යෙදී සිටි ගණන |
| පර්යේෂණ සහකාර (රජයේ සේවයේ නොවන) | 36 | 15 | 63 |
| පර්යේෂණ සහකාර (රජයේ සේවයේ නියුතු) | 14 | 13 | 89 |
| ලේකම් | 45 | 43 | 220 |
| යතුරු ලේඛක | 43 | 44 | 220 |
| රියැදුරු | 52 | 46 | 215 |
| කාර්යාල කාර්ය සහයක | 36 | 36 | 221 |

2013 දෙසැම්බර් 31 දිනට සේවයේ නියුතු මුළු සංඛ්‍යාව 1028 කි.
2013 වර්ෂය තුළදී කාර්ය මණ්ඩල සඳහා හැඳුනුම්පත් 94ක් නිකුත් කර ඇත.

**යහපාලනය ග්‍රන්ථයේ දෙමළ භාෂා පරිවර්තනය එළි දැක්වීම.**

රාජ්‍ය භාෂා සංකල්පය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරමින්, 2012 වසරේදී එළි දක්වන ලද "සුහද ඇරයුම ඔබටමයි" ග්‍රන්ථය මෙම වසරේදී දෙමළ භාෂාවට පරිවර්තනය කර මුද්‍රණය කරවන ලදී. යහ පාලනය පිළිබඳ පණිවුඩය දෙමළ ජනතාව අතරට ද ගෙනයාමේ අරමුණෙන් 2013 වසරේ දී මෙම ග්‍රන්ථය නැගෙනහිර පළාතේ දී උත්සවාකාරයෙන් එළි දක්වන ලදී. මෙහිදී ලැබුණු ප්‍රතිචාර අතිශයින් ප්‍රශංසනීය බව වාර්තා කරනුයේ ඉමහත් සතුටකිනි.

**ගරු මන්ත්‍රීවරුන්ගේ පුද්ගලික කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.**

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් මහජනතාව වෙත සපයනු ලබන සේවාවන් ඵලදයි සහ කාර්යක්ෂම ලෙස ඉටුකිරීම සඳහා ඔවුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල ගරු මන්ත්‍රීතුමාට සහයවන්නේ කවර ආකාරයෙන් ද යන්න සම්බන්ධයෙන් පුහුණුකිරීම සඳහා මෙම අමාත්‍යාංශය විසින් පුහුණු වැඩසටහන් මාලාවක් දිවයින පුරා ක්‍රියාත්මක කරනු ලබයි. මෙම පුහුණු වැඩසටහන් වලට පරිගණක භාවිතය, කාර්යාල ක්‍රම, යහපාලනය, පාර්ලිමේන්තුවේ කාර්යභාරය, මහජන සම්බන්ධතා, ඵලදයිතාවය සහ පංචවිධ සංකල්පය මෙන්ම මානව හිමිකම් යන විෂයයන් ඇතුළත් වේ. මෙම පාඨමාලාවන් පැවැත්වීමේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, මානව හිමිකම් කොමිෂන් සභාව, ජාතික ඵලදයිතා ලේකම් කාර්යාලය සහ ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ සහයෝගය ලබා ගැනේ.

මෙයට අමතරව දිනෙන් දින ඉහළ යන රථවාහන අනතුරු සංඛ්‍යාව පිළිබඳවත්, ගරු මන්ත්‍රීවරුන්ගේ ආරක්ෂාව හා මහජනතාවගේ ආරක්ෂාව පිළිබඳවත් අවධානය යොමු කරමින් වඩාත් විනය ගරුක රියැදුරන් පිරිසක් බිහිකිරීම උදෙසා කොළඹ රථවාහන පොලීසියේ සම්පත් දයකත්වය මත ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ රියැදුරු කාර්ය මණ්ඩලය පුහුණු කිරීමේ විශේෂ වැඩසටහනක් ද ක්‍රියාත්මක කරනු ලබයි.

එමෙන්ම ජ්‍යෙෂ්ඨ මාණ්ඩලික නිලධාරීන් සඳහා පාර්ලිමේන්තු කාරක සභා සහ අණපනත් පිළිබඳ වැඩසටහන් කිහිපයක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ද සහාය ඇතිව පවත්වන ලදී. එම වැඩසටහන් ප්‍රාදේශීය ලේකම්වරුන් ඇතුළුව ප්‍රාදේශීයව සේවය කරන මාණ්ඩලික නිලධාරීන් උදෙසා 2013 පෙබරවාරි (දකුණු පළාත), 2013 මැයි (වයඹ පළාත), 2013 සැප්තැම්බර් (සබරගමු පළාත) යන පළාත් වල පවත්වනු ලැබීය.

| හැකියා ප්‍රවර්ධන වැඩසටහන් - 2013 | | | | | |
|---|---|---|---|---|---|
| අනු අංකය | මාසය | දිස්ත්‍රික්කය | සහභාගී වූ කණ්ඩායම | දින ගණන | ස්ථානය |
| 01 | පෙබරවාරි | ගාල්ල<br>මාතර<br>හම්බන්තොට | මන්ත්‍රී කාර්ය මණ්ඩල | 02 | දකුණු පළාත් කළමනාකරණ පුහුණු ආයතනය - වක්වැල්ල |
| 02 | පෙබරවාරි | ගාල්ල<br>මාතර<br>හම්බන්තොට | ප්‍රාදේශීය ලේකම්වරුන් | 01 | දකුණු පළාත් කළමනාකරණ පුහුණු ආයතනය - වක්වැල්ල |
| 03 | මැයි | පුත්තලම<br>කුරුණෑගල | මන්ත්‍රී කාර්ය මණ්ඩල | 02 | වයඹ පළාත් කළමනාකරණ පුහුණු ආයතනය - වාරියපොල |
| 04 | මැයි | පුත්තලම<br>කුරුණෑගල | ප්‍රාදේශීය ලේකම්වරුන් | 01 | වයඹ පළාත් කළමනාකරණ පුහුණු ආයතනය - වාරියපොල |
| 05 | ජුනි | අනුරාධපුර<br>පොළොන්නරුව<br>බදුල්ල<br>කළුතර | රියැදුරන් | 01 | ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු ආයතනය - පැලවත්ත. |
| 06 | ජුනි | යාපනය<br>වන්නි | රියැදුරන් | 01 | ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු ආයතනය - පැලවත්ත. |
| 07 | අගෝස්තු | - | අමාත්‍යාංශ නිලධාරීන් | | සමනලවැව සමෘද්ධි ආයතනය |
| 08 | සැප්තැම්බර් | රත්නපුර<br>කෑගල්ල | මන්ත්‍රී කාර්ය මණ්ඩල | 02 | සී/ස රත්නපුර දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු සංගම් ශ්‍රවණාගාරය |
| 09 | සැප්තැම්බර් | රත්නපුර<br>කෑගල්ල | ප්‍රාදේශීය ලේකම්වරුන් | 01 | සී/ස රත්නපුර දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු සංගම් ශ්‍රවණාගාරය |
| 10 | දෙසැම්බර් | ත්‍රිකුණාමලය<br>දිගාමඩුල්ල<br>මඩකලපුව | මන්ත්‍රී කාර්ය මණ්ඩල | 02 | කළමනාකරණ සංවර්ධන පුහුණු දෙපාර්තමේන්තුව -උප්පුවේලි |
| 11 | දෙසැම්බර් | - | අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය | 01 | ගල්කිස්ස |

## මන්ත්‍රී සේවා සැපයීම් අංශය

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් විසින් මහජනයා උදෙසා ක්‍රියාත්මක කරනු ලබන සේවාවන් වඩාත් පහසු ලෙස හා කාර්යක්ෂමව ඉටු කිරීම සඳහා ගරු මන්ත්‍රීවරුන්ගේ සුබසාධනය වෙනුවෙන් මෙම අමාත්‍යාංශයේ මන්ත්‍රී සේවා සැපයීම් අංශය මගින් 2013 වසර තුළ ඉටු කරන ලද සේවාවන්හි ප්‍රගතිය පහත සඳහන් වේ.

**01. ගරු මන්ත්‍රීවරුන්ගේ ප්‍රවාහන පහසුකම් සඳහා වාහන ලබා දීම.**

i. 12 වන පාර්ලිමේන්තුවේ සහ 13 වන පාර්ලිමේන්තුවේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා මෙම අමාත්‍යාංශය මගින් ලබා දෙන ලද වාහන අතුරින් 2013 වසර වන විට වාහන 03 ක් ක්ෂය වටිනාකම ගෙවා අවසන් වූ පසු අදාළ ගරු මන්ත්‍රීවරුන්ගේ නමට පවරා දෙන ලදී.

ii. 2013 වසරට අදාළව දැනට පාර්ලිමේන්තුව නියෝජනය කරනු ලබන මන්ත්‍රීවරු විසින් ක්ෂය පදනම මත ලබා ගෙන ඇති වාහන 05 ක් සඳහා තුන්වන පාර්ශවයේ රක්ෂණ හා වාහන 05 ක් සඳහා නිදහස් ආදායම් බලපත්‍ර ලබා දීම සිදු කරන ලදී.

iii. මෙම අමාත්‍යාංශය විසින් 12 වන පාර්ලිමේන්තුවේ සහ 13 වන පාර්ලිමේන්තුවේ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙත ලබා දී ඇති වාහන වලට අදාළව ක්ෂය වටිනාකම් ලෙස රු. 697,972.80 ක් 2013 වසර තුළදී අය කර ගෙන ඇත.

iv. තීරු බදු රහිත වාහන බලපත්‍ර ලබා දීම උදෙසා 2005 අගෝස්තු 31 හා 2007 ඔක්තෝම්බර් 03 දරණ අමාත්‍ය මණ්ඩල තීරණ පරිදි මෙම අමාත්‍යාංශය විසින් 2013 වසර තුළ ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් 06 දෙනෙකු වෙත තීරුබදු රහිත වාහන ආනයන බලපත්‍ර නිකුත් කර ඇත.

**02. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වන සමූහ රක්ෂණ ක්‍රමය.**

ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වෙනුවෙන් වූ සමූහ රක්ෂණ ක්‍රමය යටතේ, රුපියල් ලක්ෂ දෙකක උපරිම සීමාවට යටත්ව ගරු මන්ත්‍රීවරුන් සඳහා ජාතික රක්ෂණ භාර අරමුදල මගින් නේවාසික රෝහල් ගාස්තු, වෛද්‍ය පරීක්ෂණ (රු.6000/-) හා ඇස් කණ්ණාඩි (රු.5000/-) ලබා ගැනීම සඳහා රක්ෂණ ප්‍රතිලාභ ගෙවීම සිදු කරනු ලබයි.

| | |
|---|---|
| 2013.01.01 සිට 2013.12.31 දින දක්වා ඉදිරිපත් වූ රක්ෂණ ප්‍රතිලාභ අයදුම්පත් ගණන | 92 |
| ගෙවන ලද මුළු ප්‍රතිලාභ (රු) | 8,360,303.00 |

**ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ හදිසි අනතුරු රක්ෂණය.**

මේ යටතේ හදිසි අනතුරකදී හෝ ත්‍රස්තවාදී ප්‍රහාරයකින් මිය යන ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා අවස්ථානුකූලව රුපියල් මිලියන පහක මුදලක් ලබා දෙනු ලබන අතර මේ වසරට අදාළව එවැනි අවස්ථාවක් උදා වී නැත.

**03. ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා වසර තුනකට වරක් කාර්යාල උපකරණ සැපයීම.**

මෙම අමාත්‍යාංශය විසින් වසර තුනකට වරක් මන්ත්‍රීවරයෙකු සඳහා පරිගණක යන්ත්‍රයක්, ඡායා පිටපත් යන්ත්‍රයක්, ෆැක්ස් යන්ත්‍රයක් හා ජංගම දුරකථනයක් මිලදී ගැනීම සඳහා රු.350,000/- ක ප්‍රතිපාදන වෙන් කර දෙනු ලබන අතර මේ සඳහා ගරු මන්ත්‍රීවරයෙකුගෙන් අය කරනු ලබන්නේ මුළු මුදලින් 17% කට ආසන්න ප්‍රතිශතයකි. ඒ අනුව 2013 වසර තුළ ගරු මන්ත්‍රීවරු 104 දෙනෙකු සඳහා උපකරණ මිලට ගැනීමට රු. 33,462,164/- මුදලක් වැය කර ඇති අතර එමගින් පහත දැක්වෙන උපකරණ ප්‍රමාණයන් මන්ත්‍රී සේවා සැපයීම් අංශය මගින් ලබා දී ඇත.

| | **උපකරණ වර්ගය** | **ලබා දී ඇති ප්‍රමාණය** |
|---|---|---|
| i. | පරිගණක යන්ත්‍ර | 94 |
| ii. | ඡායා පිටපත් යන්ත්‍ර | 96 |
| iii. | ෆැක්ස් යන්ත්‍ර | 96 |
| iv. | ජංගම දුරකථන | 93 |

04. ප්‍රගති සමාලෝචන ක්‍රියාකාරකම්

i. වාර්ෂික ප්‍රගති වාර්තාව සකස් කර පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම.
ii. අමාත්‍යාංශ පාලන වාර්තා සකස් කිරීම.
iii. වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම.

## මූල්‍ය අංශය

අමාත්‍යාංශය වෙත මහා භාණ්ඩාගාරය මඟින් ලබා දෙන ප්‍රතිපාදන වාර්ෂිකව ඇස්තමේන්තු ගත කාර්යයන් සඳහා විධිමත් හා මනා කළමනාකරණයකින් යුතුව වැය කිරීම තුළින් මූල්‍ය කටයුතු මෙහෙයවීම හා සම්බන්ධීකරණය කිරීම, විසර්ජන ගිණුම සහ අනෙකුත් ගිණුම් වාර්තා පවත්වාගෙන යාම මෙම අංශයට පැවරුණ ප්‍රධාන කාර්යභාර වේ.

තවද,

- මන්ත්‍රී කාර්ය මණ්ඩලයට වැටුප් ගෙවීම, සේවය අවසන් කරනු ලැබූ මන්ත්‍රී කාර්ය මණ්ඩලය සඳහා පාරිතෝෂික ගෙවීම, මන්ත්‍රී කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන් සඳහා ගෙවීම් කටයුතු කිරීම.
- මන්ත්‍රීවරුන්ට උපකරණ සැපයීම සඳහා චෙක්පත් නිකුත් කිරීම.
- අමාත්‍යාංශයේ සියලුම ගෙවීම් කටයුතු සම්බන්ධීකරණය කරමින් මූල්‍ය පාලනය පවත්වා ගෙන යාම.
- වියදම් ගිණුම් ගත කිරීම හා මාසික හා වාර්ෂික ගිණුම් භාණ්ඩාගාරය වෙත ඉදිරිපත් කිරීම.
- රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් B ගිණුම පවත්වා ගෙන යාම.
- වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය මූල්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීම.
- නිල බැංකු ගිණුම පවත්වාගෙන යාම හා සැසඳුම් ප්‍රකාශ පිළියෙල කිරීම.
- විගණන විමසුම් සඳහා පිළිතුරු සැපයීම ද මෙම අංශය මගින් ඉටු කෙරෙන කාර්යයන් ලෙස දැක්විය හැක.

**ගිණුම් අංශය**
**2013/12/31 දිනට පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් පිළිබඳ වාර්තා**

| | වැඩසටහන 01 රු. | වැඩසටහන 02 රු. | මුළු වියදම රු. |
|---|---|---|---|
| **පුනරාවර්තන වියදම** | | | |
| වැටුප් හා වේතන | 4,714,151 | 12,092,020 | 16,806,171 |
| අතිකාල හා නිවාඩු දින වැටුප් | 1,193,875 | 771,791 | 1,965,666 |
| වෙනත් දීමනා | 2,761,592 | 301,689,564 | 304,451,156 |
| ගමන් වියදම් - දේශීය | 687,488 | 237,857 | 925,345 |
| ගමන් වියදම් - විදේශීය | 26,474 | - | 26,474 |
| ලිපි ද්‍රව්‍ය හා කාර්යාලයීය අවශ්‍යතා | 115,680 | 774,286 | 889,966 |
| ඉන්ධන | 6,135,781 | 1,940,799 | 8,076,580 |
| ආහාර පාන හා නිල ඇඳුම් | 1,200 | 52,387 | 53,587 |
| වෙනත් සැපයීම් | | 9,400 | 9,400 |
| වාහන නඩත්තු වියදම් | 2,164,006 | 878,215 | 3,042,221 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු | 8,800 | 235,114 | 243,914 |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් නඩත්තු වියදම් | - | - | - |
| ප්‍රවාහන සේවා | - | - | - |
| තැපැල් හා සන්නිවේදන | 622,249 | 971,345 | 1,593,594 |
| විදුලිය සහ ජලය | 26,140 | 2,116,643 | 2,142,783 |
| බදු කුලී හා පළාත් පාලන ආයතන බදු | 200,000 | 6,843,808 | 7,043,808 |
| වෙනත් සේවා | 499,544 | 13,958,736 | 14,458,280 |
| විශ්‍රාමික ප්‍රතිලාභ | | 10,890,929 | 10,890,929 |
| රජයේ සේවකයින් සඳහා දේපල ණය පොලී | | 264,811 | 264,811 |
| එකතුව | **19,156,980** | **353,727,705** | **372,884,685** |
| **මූලධන වියදම** | | | |
| **මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩි දියුණු කිරීම** | | | |
| ගොඩනැගිලි සහ ඉදිකිරීම් | - | - | - |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ නඩත්තු | | 215,672 | 215,672 |
| වාහන | 708,867 | 660,222 | 1,369,089 |
| **මූලධන වත්කම් අත්පත්කර ගැනීම** | | | |
| වාහන | 7,783,655 | - | 7,783,655 |
| ගෘහ භාණ්ඩ සහ කාර්යාලයීය උපකරණ | 925,000 | 504,149 | 1,429,149 |
| යන්ත්‍ර සහ යන්ත්‍රෝපකරණ | 200,000 | 736,200 | 936,200 |
| **ප්‍රාග්ධන මාරු කිරීම්** | | | |
| සංවර්ධන සහායන් | - | 33,462,164 | 33,462,164 |
| **මානව සම්පත් සංවර්ධනය** | | | |
| පුහුණු කිරීම් හා හැකියා ප්‍රවර්ධනය | - | 4,743,630 | 4,743,630 |
| එකතුව | **9,617,522** | **40,322,037** | **49,939,559** |

**පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.**
**2013 මූල්‍ය ප්‍රගතිය**

| **(1) පුනරාවර්තන වියදම්** | **ශුද්ධ ප්‍රතිපාදන(රු)** | **වියදම(රු)** | **මූල්‍ය ප්‍රගතිය** |
|---|---|---|---|
| වැටුප් හා වේතන | 16,806,172 | 16,806,171 | 99.9% |
| අනිකුත් පුනරාවර්තන වියදම් | 356,193,828 | 356,078,513 | 99.9% |
| මුළුපුනරාවර්තන වියදම | 373,000,000 | 372,884,685 | 99.9% |
| **(2) ප්‍රාග්ධන වියදම්** | | | |
| **(i) මූලධන වත්කම් පුනරුත්ථාපනය හා වැඩිදියුණු කිරීම** | **2,600,000** | **1,584,761** | **60.9%** |
| ගොඩනැගිලි ඉදිකිරීම් | 0 | 0 | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 300,000 | 215,672 | |
| වාහන | 2,300,000 | 1,369,089 | |
| **(ii) මූලධන වත්කම් අත්පත් කර ගැනීම** | **10,386,150** | **10,149,004** | **97.7%** |
| වාහන | 8,000,000 | 7,783,655 | |
| ගෘහ භාණ්ඩ හා කා.උප. | 1,429,150 | 1,429,149 | |
| යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ | 957,000 | 936,200 | |
| **(iii) ප්‍රාග්ධන මාරු කිරීම් සංවර්ධන සහායන්** | **34,106,000** | **33,462,164** | **98.1%** |
| පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් සඳහා උපකරණ ලබාදීම | 34,106,000 | 33,462,164 | |
| **(iv) මානව සම්පත් සංවර්ධනය** | **4,907,850** | **4,743,630** | **96.6%** |
| පුහුණු කිරීම් හා හැකියා වර්ධනය. | 4,907,850 | 4,743,630 | |
| මුළු ප්‍රාග්ධන වියදම් | 52,000,000 | 49,939,559 | 96.0% |

**පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**
**රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම**
**2013**

| | වියදමෙහි උපරිම සීමාව(රු) | ලැබීම් වල අවම සීමාව (රු) | හර ශේෂයේ උපරිම සීමාව (රු) |
|---|---|---|---|
| **අනුමත සීමාවන්** | 6,000,000 | 2,000,000 | 21,500,000 |
| **වර්ෂය අවසානයේ සත්‍ය අගයන්** | 3,818,654 | 4,324,331 | 8,324,796 |

## පාලන අංශය

අමාත්‍යාංශයේ විෂයය පථයට අයත් සියළුම පාලන හා ආයතනික කටයුතු මැනවින් සංවිධානය කොට ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධීකරණය පාලන අංශයට පැවරේ.

- පාර්ලිමේන්තු උපදේශක කාරක සභාව සම්බන්ධව කටයුතු කිරීම.
- ජනාධිපති කාර්යාලය, අග්‍රාමාත්‍ය කාර්යාලය, සහ අනෙකුත් අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ආයතන සමග සම්බන්ධීකරණය.
- අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ සාමාන්‍ය පරිපාලනය හා විනය පවත්වා ගෙන යාම.
- අමාත්‍යාංශ නිලධාරීන්ගේ ආයතන කටයුතු කිරීම.
- නිලධාරීන්ගේ පෞද්ගලික ලිපිගොනු පවත්වාගෙන යාම හා යාවත්කාලීන කිරීම.
- ගරු අමාත්‍යතුමියගේ පෞද්ගලික කාර්ය මණ්ඩලයට අදළ ආයතනික කටයුතු.
- අමාත්‍යාංශ කාර්ය මණ්ඩලවලට රාජකාරී හැඳුනුම්පත් ලබා දීම.
- අමාත්‍යාංශ කාර්ය මණ්ඩලයේ අවශ්‍යතා අනුව ණය මුදල් අනුමත කිරීම.
- අමාත්‍යාංශය සතුව පවතින සියළුම වාහන නඩත්තුව හා ප්‍රවාහන පහසුකම් සැලසීම.
- අමාත්‍යාංශයේ සියළුම අංශවල සේවය කරන කාර්ය මණ්ඩලයට යහපත් මානසිකත්වයකින් තම සේවය උපරිම මට්ටමකින් ලබා දිය හැකි වන පරිදි අවශ්‍ය භෞතික පරිසරය සකස් කිරීම.
- දෛනික තැපෑල විධිමත්ව බෙදහැරීම සහ පිටතට යැවෙන ලිපි ක්‍රමාණුකූලව බෙද හැරීම තුළින් පරිපාලනය කාර්යක්ෂම කිරීම.
- අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය පුහුණු කිරීම.
- අමාත්‍යාංශයේ සියළුම ප්‍රසම්පාදන කටයුතු.

**පරිගණක අංශය**

- අමාත්‍යාංශයේ පරිගණක පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම හා ඊට අදළ විද්‍යුත් හා ඉලෙක්ට්‍රෝනික උපාංග ක්‍රියා කරවීම හා නඩත්තුව.
- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ තොරතුරු ඇතුළත් දත්ත පද්ධතිය යාවත්කාලීනව පවත්වාගෙන යාම හා අමාත්‍යාංශයේ අවශ්‍යතාවන්ට අනුව විවිධ තොරතුරු ඇතුළත් වාර්තාවන් සැකසීම.
- අන්තර්ජාලය හා විද්‍යුත් තැපෑල කාර්යක්ෂමව පවත්වා ගෙන යාම.
- ලංකා රාජ්‍ය ජාල ව්‍යාපෘතිය මගින් ලබා දී ඇති පරිගණක ජාලය පවත්වා ගෙන යාම.
- අමාත්‍යාංශයේ විෂයය පථයට අදළ වන තොරතුරු ඇතුළත් දත්ත බැංකු පවත්වාගෙන යාම හා පරිගණක වැඩසටහන් සම්පාදනය කිරීම.
- කාර්යාලයීය නිලධාරීන්ගේ පරිගණක කටයුතු සඳහා සහාය වීම.
- ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික කාර්ය මණ්ඩල සඳහා පරිගණක පුහුණුව ලබා දීම.
- අමාත්‍යාංශයේ මාධ්‍ය කටයුතු ආවරණය කිරීම.
- අමාත්‍යාංශයේ වෙබ් අඩවිය (www.minparliament.gov.lk) පවත්වාගෙන යාමේ කටයුතු.

## පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ අනුමත කාර්ය මණ්ඩලය

| තනතුර | අනුමත සංඛ්‍යාව | සිටින සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| ලේකම් | 01 | 01 | - |
| අතිරේක ලේකම් | 01 | 01 | - |
| ජ්‍යේෂ්ඨ සහකාර ලේකම් | 01 | 01 | - |
| ප්‍රධාන ගණකාධිකාරී | 01 | 01 | - |
| අධ්‍යක්ෂ | 01 | 01 | - |
| සහකාර ලේකම් | 01 | - | 01 |
| ගණකාධිකාරී | 01 | 01 | - |
| ගණකාධිකාරී (අභ්‍යන්තර විගණන) | 01 | - | 01 |
| භාෂා පරිවර්තක (සිංහල/ඉංග්‍රීසි)( ඉංග්‍රීසි/දෙමළ) | 02 | - | 02 |
| පරිපාලන නිලධාරී (රා.ක.ස.සේ. අධි පන්තිය) | 01 | 01 | - |
| රා. කළමනාකරණ සහකාර | 20 | 13 | 07 |
| ප්‍රසම්පාදන සහකාර | 01 | 01 | - |
| වැඩසටහන් සැලසුම් සහකාර | 06 | 06 | - |
| ගිණුම් සහකාර | 03 | 03 | - |
| සංවර්ධන නිලධාරී | 04 | 03 | 01 |
| තොරතුරු තාක්ෂණ සහකාර | 02 | 02 | - |
| පිළිගැනීමේ නිලධාරිනී | 01 | 01 | - |
| ලේකම්ගේ සම්බන්ධීකරණ ලේකම් | 01 | 01 | - |
| කාර්යාල සේවක සේවය | 09 | 09 | - |
| රියැදුරු සේවය | 10 | 07 | 03 |
| **එකතුව** | **68** | **53** | **15** |

## 2013 වසර තුළ අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩල වෙනස් වීම්.

### බඳවා ගන්නා ලද නවක නිලධාරීන්

| නම | තනතුර | පත්වීමේ දිනය |
|---|---|---|
| 01. ආර්.එම්.ඩී.පී රත්නායක මයා | කා.සේ.සේ. III | 2013.12.02 |

### ස්ථාන මාරු ලබා ගිය නිලධාරීන්

| නම | තනතුර | ස්ථාන මාරු දිනය |
|---|---|---|
| 01. එල්.ජී.පී.හේමන්ති මිය | රා.කළ.ස. II | 2013.01.01 |
| 02. එම්.ඒ.ජී.එන්.මලලසිංහ මිය | රා.කළ.ස. III | 2013.01.01 |
| 03. ඊ.වී.නලින් ප්‍රසන්න මයා | රියදුරු III | 2013.03.18 |
| 04. රෂිකා මහවිතාන මිය | රා.කළ.ස. II | 2013.08.13 |
| 05. බී.ජේ.ජීවශාන්ත මයා | රියදුරු I | 2013.07.31 |
| 06.ආර්.ඒ.එස්.සෙනෙවිරත්න මයා | කා.සේ.සේ. III | 2013.09.03 |

### සේවයට වාර්තා කළ නිලධාරීන්

| නම | තනතුර | පැමිණි දිනය |
|---|---|---|
| 01. ඩී.සුනේත්‍රා වෙත්තසිංහ මිය | රා.කළ.ස. II | 2013.01.04 |
| 02. එල්.ඒ.එන්.ජේ.විමලරත්න මයා | රා.කළ.ස. I | 2013.01.07 |
| 03. වයි.වී.එස්.ජී.යටිවල මිය | වැ.ස.සැ.ස | 2013.02.27 |
| 04. බී.ජේ.ජීවශාන්ත මයා | රියදුරු I | 2013.06.03 |
| 05. කේ.පී.සුරංගිකා මෙය | කා.සේ.සේ. III | 2013.09.02 |
| 06. කේ.ඩී. දිල්හානි මෙය | සං.නි. | 2013.09.20 |
| 07. එච්.පී.නදීකා දමයන්ති මෙය | සං.නි. | 2013.09.20 |
| 08. මුදිතා කොලොන්නෙ මිය | ශ්‍රී.ලං.තො.ස.තා.සේ.III | 2013.11.23 |
| 09. චාමිකා දීපාලි සේනානායක මෙය | වැ.ස.සැ.සහකාර | 2013.11.11 |
| 10. ඒ.පී.අනුලා විජේරත්න මිය | ශ්‍රී.ලං.ග.සේ. I | 2013.11.14 |

### සේවයෙන් විශ්‍රාම ගන්නා ලද නිලධාරීන්

| නම | තනතුර | විශ්‍රාම ගත් දිනය |
|---|---|---|
| 01. ඩී.ආර්.වෙත්තසිංහ මයා | රියදුරු | 2013.08.06 |
| 02. පී.ඒ.පීරිස් මිය | ප්‍ර.ග | 2013.11.05 |

### සේවයෙන් ඉවත්වී ගිය නිලධාරීන්

| නම | තනතුර | ඉවත්වී ගිය දිනය |
|---|---|---|
| 01. ඩබ්.අයි.යූ.පී.පියතුංග මෙය | සං.නි. | 2013.06.01 |
| 02. පී.හසන්ති කුමුදුනී මෙය | සං.නි. | 2013.08.30 |

## කාර්ය මණ්ඩල පුහුණු - 2013

ආයතනයක කාර්ය මණ්ඩලය පුහුණු කිරීම සේවා කාර්යක්ෂමතාවයට හා ඵලදායීතාවයට බෙහෙවින් ඉවහල් වන කරුණකි. මෙම අමාත්‍යාංශයේ මාණ්ඩලික නිලධාරීන් ඇතුළු බොහෝ නිලධාරීන් 2013 වර්ෂය තුළදී දේශීය වශයෙන් විවිධ වූ පුහුණු පාඨමාලා හා වැඩමුළු සඳහා සහභාගී වී ඇත. 2013 වර්ෂය තුළදී අමාත්‍යාංශයේ නිලධාරීන් කිසිවකුට විදේශ පුහුණු සඳහා සහභාගිවීමට අවස්ථා ලැබී නොමැති අතර 2013 වර්ෂය තුළ අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා ලබා දෙන ලද දේශීය පුහුණු පාඨමාලා පිළිබඳ විස්තර පහත පරිදි වේ.

| පාඨමාලාවේ නම | සහභාගී වූ අයගේ නම | පවත්වන ලද ස්ථානය | දිනය |
|---|---|---|---|
| සිගාස් පුහුණු වැඩසටහන | කේ.ආර්.සී.කුමුදුනී මිය. | මිලෝද ආයතනය - කොළඹ 01 | 2013.01.28-2013.02.02 |
| රාජ්‍ය මූල්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණුව | ආර්.බී.යූ.ශ්‍රීමාලි මෙය. | රාජ්‍ය සේවා පුහුණු ආයතනය - කොළඹ 07 | 2013.02.18-2013.02.22 |
| රා.කළ. සහකාර සේවයේ නවක නිලධාරීන් සඳහා වූ දින 10 ක සේවාරම්භක පුහුණු පාඨමාලාව | එන්.ඩී.වික්‍රමාරච්චි මිය. | මිනින්දෝරු දෙපාර්තුමේන්තුව | 2013.02.18-2013.03.04 |
| මානව සම්පත් කළමනාකරණය | එස්.එච්.යූ.එන්.ධම්මික මයා. | රාජ්‍ය සේවා පුහුණු ආයතනය - කොළඹ 07 | 2013.03.18-2013.03.22 |
| මානව සම්පත් කළමනාකරණය | බී.ජී.ඩබ්.ඒ.ඒ.ජේ.ජයසිංහ මිය | රාජ්‍ය සේවා පුහුණු ආයතනය - කොළඹ 07 | 2013.03.18-2013.03.22 |
| රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් බී ගිණුම | ඩී.එම්.අයි.මේරිස් මිය. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2013.03.27-2012.04.27 |
| වීඩියෝ සංස්කරණය | එන්.පී.කළුතොට මහතා | ක්ලච් ඔටෝ මේෂන් ප්‍රයිවට් ලිමිටඩ් | 2013.08.21-2013.08.24 |
| රජයේ විගණන කටයුතු පිළිබඳ පාඨමාලාව | එස්.ඩී.කේ.ආර්.ආරියරත්න මිය. | ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනය | 2013.09.17-2013.09.18 |
| සිගාස් පුහුණු වැඩසටහන | ආර්.එච්.සී.පී.කේ.රණමුක මිය. | මිලෝද ආයතනය | 2013.12.12 |

## අභ්‍යන්තර විගණන අංශය

මෙම අංශය මගින් අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු ඉටු කරනු ලබයි. කළමනාකරණ විගණන දෙපාර්තමේන්තු මාර්ගෝපදේශ වලට අනුව 2013 වර්ෂය අදාළව කළමනාකරණ කමිටුව රැස්වී සාකච්ඡා කර ඇති අතර ලේකම්තුමියගේ උපදෙස් පරිදි කරුණු පරීක්ෂාකර යෝජනා හා නිරීක්ෂණ ඉදිරිපත් කර අවශ්‍ය කටයුතු කර ඇත.

**<u>රැස්වීම් පැවති දිනයන් හා රැස්වීම් පිළිබඳ විස්තර</u>**

2013.01.29 මූලික වාර්තා ඉදිරිපත් කිරීම හා 2012 හතරවන කාර්තු රැස්වීම

2013.05.10 2013 පළමු කාර්තු රැස්වීම

2013.07.30 2013 දෙවන කාර්තු රැස්වීම

2013.10.25 2013 තුන්වන කාර්තු රැස්වීම

**<u>සහභාගී වූ නිලධාරීන්</u>**

සභාපති - ප්‍රින්සි ජයතුංග මහත්මිය - ලේකම්, පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.

කැඳවුම්කරු - චන්ද්‍රා මියනවල මහත්මිය - අතිරේක ලේකම්, පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.

සාමාජික - පී.ඒ. පීරිස් මහත්මිය - ප්‍රධාන ගණකාධිකාරී, පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය.

සාමාජික - එච්.සී.ඩී.එල්.සිල්වා මහතා - අධ්‍යක්ෂ - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව.

සාමාජික - ඒ.හපුගල මහතා - අධ්‍යක්ෂ - කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුව.

නිරීක්ෂක - රම්‍යා පෙරේරා මහත්මිය - විගණන අධිකාරී - විගණන දෙපාර්තමේන්තුව

අමාත්‍යාංශයේ වාර්ෂික විගණන සැලැස්ම ක්‍රියාත්මක කර ඇති අතර කළමනාකරණ විගණන චක්‍රලේඛ අනුව කාර්තුමය රැස්වීම් නිසි පරිදි පවත්වා ඇත. කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය සහතික වන අයුරින් අමාත්‍යාංශයේ සියළු අංශ ආවරණය වන පරිදි විගණන කටයුතු සිදුකර ඇති අතර ඒ පිළිබඳව ප්‍රශංසාත්මක තත්ත්වයක් පවතින බව රැස්වීම් වාර වලදී ප්‍රකාශ වී ඇත.

<u>ගරු ඇමතිතුමියගේ කාර්ය මණ්ඩලය</u>


| | | |
|---|---|---|
| | සුමේධා ජී. ජයසේන මැතිනිය | ගරු ඇමතිතුමිය |
| 01. | බී.අයි.අයි. ද සිල්වා මහතා | පෞද්ගලික ලේකම් |
| 02. | ඩබ්.එම්.එස්.විජේකෝන් මහතා | මාධ්‍ය ලේකම් |
| 03. | ඩී.එම්.ඒ.අයි. දිසානායක මහතා | සම්බන්ධීකරණ ලේකම් |
| 04. | රත්නසිරි වාදසිංහ මහතා | සම්බන්ධීකරණ ලේකම් |
| 05. | රේණුකා නවගමුව මහත්මිය | සහකාර ලේකම් කම්කරු සබඳතා (ශ්‍රී.ලං.ප.සේ. නොවන) |
| 06. | ඩී.කේ.ආර්.වීරසේකර මහතා | උපදේශක |
| 07. | එච්.ඩබ්. අජිත් ප්‍රියන්ත මහතා | මහජන සම්බන්ධතා නිලධාරි |
| 08. | ඉඳුනිල් ගලප්පත්ති මහතා | පෞද්ගලික සහකාර |
| 09. | ආර්.එම්.නිශ්ශංක රත්නායක මහතා | කළමණාකරණ සහකාර |
| 10. | ඩී.එම්.නවරත්න මහතා | කළමණාකරණ සහකාර |
| 11. | එම්.පී.පී.ගුණවර්ධන මහතා | කළමණාකරණ සහකාර |
| 12. | බී.සී.සී.සිල්වා මහතා | කළමණාකරණ සහකාර |
| 13. | නීල් කුමාර රත්නායක මහතා | කළමණාකරණ සහකාර |
| 14. | බී.බී.ගුණරත්න මහතා | රියැදුරු |
| 15. | ඩී.එම්.උබේවර්ධන මහතා | රියැදුරු |
| 16. | ඩබ්.ඩී.ඒ.ගුණවර්ධන මහතා | රියැදුරු |
| 17. | එන්.එම්.එස්.බී.පී.විජේරත්න මහතා | රියැදුරු |
| 18. | ඩබ්.එම්.ජයවර්ධන මහතා | රියැදුරු |
| 19. | තිස්ස ධර්මදස මහතා | රියැදුරු (ඒකාබද්ධ සේවය) |
| 20. | ඩී.එම්.ඒ.පී.ආරියරත්න මහතා | රියැදුරු (ඒකාබද්ධ සේවය) |
| 21. | එච්.එච්.සුමුදු නිරෝෂා මෙය | කාර්යාල කාර්ය සහයක |
| 22. | එච්.එම්.ඊ.එම්.ගුණතිලක මිය | කාර්යාල කාර්ය සහයක |

## පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ කාර්ය මණ්ඩලය


| අනු අංකය | නම | තනතුර |
|---|---|---|
| 01. | ප්‍රින්සි ජයතුංග මහත්මිය | ලේකම් |
| 02. | චන්ද්‍රා මියනවල  මහත්මිය | අතිරේක ලේකම් |
| 03. | වජිර කඹුරුගමුව මයා | ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් |
| 04. | ආර්.ඒ.ඩී.සී.ගුණසේකර මයා | අධ්‍යක්ෂ |
| 05. | පී.ඒ.පීරිස් මිය (2013.11.05 දින දක්වා)<br>ඒ.පී.අනුලා විජේරත්න මිය (2013.11.14 දින සිට) | ප්‍රධාන ගණකාධිකාරි |
| 06. | ආර්.එච්.සී.පී.කේ.රණමුක මිය | ගණකාධිකාරි |
| 07. | එච්.ඒ.සී.පෙරේරා මිය | සහකාර ලේකම් (වැ.බ) |
| 08. | වියෝනි ප්‍රනාන්දු මිය | සම්බන්ධීකරණ ලේකම් |
| 09. | ඒ.ඩබ්.සී.දිසානායක මිය | රා.ක.ස.සේ I |
| 10. | ඩී.එච්.එස්.ප්‍රියානි මිය | රා.ක.ස.සේ I |
| 11. | එල්.ඒ.එන්.ජේ.විමලරත්න මයා | රා.ක.ස.සේ I |
| 12. | ඩී.එම්.අයිරාංගනී මේරිස් මිය | රා.ක.ස.සේ II |
| 13. | බී.එන්.පී.සී.පෙරේරා මෙය | රා.ක.ස.සේ II |
| 14. | බී.පී.ඩබ්.ඒ.ඒ.ජේ.ජයසිංහ මිය | රා.ක.ස.සේ II |
| 15. | ඩී.සුනේත්‍රා වෙත්තසිංහ මිය | රා.ක.ස.සේ II |
| 16. | බී.පී.ඩී.රත්නප්‍රභා මිය | රා.ක.ස.සේ II |
| 17. | ආර්.කේ.චමිලා කුමුදුනී මිය | රා.ක.ස.සේ III |
| 18. | ඩබ්.චන්ද්‍රදස මයා | රා.ක.ස.සේ III |
| 19. | ඩබ්.එස්.එම්.ජේ.ප්‍රනාන්දු මිය | රා.ක.ස.සේ III |
| 20. | එන්.ඩී.වික්‍රමආරච්චි මිය | රා.ක.ස.සේ III |
| 21. | ආර්.බී.යූ.ශ්‍රීමාලි මෙය | රා.ක.ස.සේ III |
| 22. | එන්.පී.කළුතොට මයා | ශ්‍රී ලංකා තොරතුරු හා  සන්නිවේදන තාක්ෂණ සේවය III |
| 23. | මුදිතා කොලොන්නෙ මිය | ශ්‍රී ලංකා තොරතුරු හා  සන්නිවේදන තාක්ෂණ සේවය III |
| 24. | ආර්.පී.යූ.එස්.රාජපක්ෂ මයා | වැඩසටහන් සැලසුම් සහකාර |
| 25. | එස්.එච්.යූ.එන්.ධම්මික මයා | වැඩසටහන් සැලසුම් සහකාර |
| 26. | යූ.එල්.සී.ඉඳුනිල් මයා | ප්‍රසම්පාදන සහකාර |

| | | |
|---|---|---|
| 27. | ආර්.එම්.පී.පී.කරුණාරත්න මයා | වැඩසටහන් සැලසුම් සහකාර |
| 28. | ආර්.එම්.එම්.පී.රත්නායක මිය | වැඩසටහන් සැලසුම් සහකාර |
| 29. | නිර්මලා විජේසුන්දර මිය | ගිණුම් සහකාර |
| 30. | එස්.ඩී.කේ.ආර්.ආරියරත්න මිය | ගිණුම් සහකාර |
| 31. | එච්.ඒ.එස්.පී.ප්‍රියංකර මයා | ගිණුම් සහකාර |
| 32. | වයි.වී.සමන්ති ගංගා යටිවල මිය. | වැඩසටහන් සැලසුම් සහකාර |
| 33. | සී.ඩී.සේනානායක මෙය | වැඩසටහන් සැලසුම් සහකාර |
| 34. | කේ.එච්.ස්වර්ණා ශ්‍රී මෙය | සංවර්ධන නිලධාරී |
| 35. | කේ.ඩී.දිල්හානි මෙනවිය | සංවර්ධන නිලධාරී |
| 36. | එච්.පී.නදීකා දමයන්ති මෙනවිය | සංවර්ධන නිලධාරී |
| 37. | එස්.ටී.ආර්.සෙනෙවිරත්න මෙය | පිළිගැනීමේ නිලධාරිනි |
| 38. | අයි.ජයවීර මයා | කා.සේ.සේ I |
| 39. | පී.පී.විජේරත්න බණ්ඩා මයා | කා.සේ.සේ I |
| 40. | එස්.ඩී.ආනන්ද මයා | කා.සේ.සේ I |
| 41. | පී.මුරුගන්ඩි මයා | කා.සේ.සේ I |
| 42. | සම්පත් දුමින්ද දෙම්පගේ මයා | කා.සේ.සේ III |
| 43. | පී.යු.විමලසිරි ගරුසිංහ මයා | කා.සේ.සේ III |
| 44. | ආර්.එම්.ඩී.පී.රත්නායක මයා | කා.සේ.සේ III |
| 45. | මාරි පිලිෂියා රණවීර මිය | කා.සේ.සේ III |
| 46. | කේ.සුරංගිකා මිය | කා.සේ.සේ III |
| 47. | කේ.ඩබ්.ප්‍රේමතිලක මයා | රියැදුරු I |
| 48. | විමලසිරි හේවාමාන මයා | රියැදුරු II (අ) |
| 49. | කේ.වී.එස්.ජයරත්න මයා | රියැදුරු II (ආ) |
| 50. | ඩී.සම්පත් සුරංග දැඩිගම මයා | රියැදුරු II (ආ) |
| 51. | බී.එම්.ආරියතිලක මයා | රියැදුරු II (ආ) |
| 52. | ටී.ඒ.කේ.බී.තිලකරත්න මයා | රියැදුරු II (ආ) |
| 53. | ජේ.එම්.එස්.කේ.විජේරත්න මයා | රියැදුරු II (ආ) |

# සංවිධාන ව්‍යුහය - පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය



## ගරු පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල පුහුණුව ආවරණය කල දිස්ත්‍රික්ක - 2013












රත්නපුර, කෑගල්ල දිස්ත්‍රික්ක වල මන්ත්‍රී කාර්ය මණ්ඩල පුහුණු වැඩසටහන - සී/ස රත්නපුර දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු සංගම් ශ්‍රවණාගාරය, නව නගරය රත්නපුර - 2013.09.25/26

இரத்தினபுரி, கேகாலை மாவட்டங்களில் பாராளுமன்ற உறுப்பினர் பதவியணிக்கான பயிற்சி நிகழ்ச்சித்திட்டம் - வ/ப இரத்தினபுரி மாவட்ட கிராமிய வங்கிச் சங்கம் கேட்போர் கூடம், புதிய நகரம் இரத்தினபுரி - 2013.09.25/26

Training Workshop for Parliamentarian Staff of Rathnapura & Kagalle Districts Conducted at the Auditorium of the Rathnapura District Cooperative Rural Bank Society Ltd. – 25/26.09.2013



යාපනය, වන්නි දිස්ත්‍රික්ක වල මන්ත්‍රී කාර්ය මණ්ඩල රියැදුරන් සහ අනෙකුත් දිස්ත්‍රික්ක වල දෙමළ මාධ්‍ය රියැදුරන් සඳහා වූ පුහුණු වැඩමුළුව - ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු ආයතනය, පැලවත්ත 2013.06.20

யாழ்ப்பாணம், வன்னி மாவட்ட பாராளுமன்ற உறுப்பினர்களின் பதவியணியின் சாரதிகள் மற்றும் ஏனைய மாவட்டங்களின் தமிழ் மொழிமூல சாரதிகளுக்கான பயிற்சிச் செயலமர்வு - நிர்மாணிப்பு, இயந்திர உபகரணங்கள் பயிற்சி நிறுவனம், பெலவத்தை - 2013.06.20

Training Workshop Conduct for Drivers in the Staffs of Parliamentarians in Jaffna & Wanni Districts and for Drivers of Tamil Stream in other Districts – Training Institute of Construction and Machinery at Pelawatta –





ගාල්ල, මාතර, හම්බන්තොට දිස්ත්‍රික්ක වල ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා පාර්ලිමේන්තු කාරක සභා අණපනත් වැඩමුළුව - දකුණු පළාත් කළමනාකරණ පුහුණු ආයතනය, වක්වැල්ල - 2013.02.21

காலி, மாத்தறை, அம்பாந்தோட்டை மாவட்டங்களின் பிரதேச செயலாளர்களுக்கான பாராளுமன்றக் குழுக்கள் மற்றும் கட்டளைச் சட்டங்கள் பற்றிய செயலமர்வு - தென் மாகாண முகாமைத்துவப் பயிற்சி நிறுவனம் வக்வெல்ல - 2013.02.21

Workshop Conducted for Divisional Secretaries of Galle, Matara, Hambantota Districts on Parliamentary Committee Enactments – Southern Province Management Training Institute at Wakwella – 21.02.2013






අමාත්‍යාංශ කාර්ය මණ්ඩලය සඳහා වූ බැහැරගත පුහුණු වැඩසටහන - සමෘද්ධි පුහුණු ආයතනය, සමනලවැව - 2013.07.20/21

அமைச்சின் பதவியணிக்கான வெளிவாரி பயிற்சி நிகழ்ச்சித்திட்டம் - சமுர்த்தி பயிற்சி நிறுவனம் - சமனலவெவ - 2013.07.20/21

Outbound Training Programme for Ministry Staff- Samurdhi Training Institute at Samanalawewa – 20/21.07.2013



පුත්තලම, කුරුණෑගල දිස්ත්‍රික්ක වල ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා පාර්ලිමේන්තු කාරක සභා අණපනත් වැඩමුළුව වයඹ පළාත් කළමනාකරණ පුහුණු ආයතනය - වාරියපොල 2013.05.14

புத்தளம், குருணாகல் மாவட்டங்களின் பிரதேச செயலாளர்களுக்கான பாராளுமன்றக் குழுக்கள் மற்றும் கட்டளைச் சட்டங்கள் பற்றிய செயலமர்வு - வடமேல் மாகாண முகாமைத்துவப் பயிற்சி நிறுவனம், வாரியபொல - 2013.05.14

Workshop Conducted for Divisional Secretaries of Puttalam & Kurunegala Districts on Parliamentary Committee Enactments – North Western Province Management Training Institute at Wariyapola – 14.05.2013



පුත්තලම, කුරුණෑගල දිස්ත්‍රික්ක වල පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩලයට පැවැත්වූ වැඩමුළුව වයඹ පළාත් කළමනාකරණ පුහුණු ආයතනය - වාරියපොල 2013.05.15/16

புத்தளம், குருணாகல் மாவட்டங்களில் பாராளுமன்ற உறுப்பினர்களின் பதவியணிக்கு நடத்தப்பட்ட செயலமர்வு, வடமேல் மாகாண முகாமைத்துவப் பயிற்சி நிறுவனம், வாரியபொல - 2013.05.15/16

Workshop Conducted for Parliamentarians staff of Puttalam & Kurunegala Districts– North Western Province Management Training Institute at Wariyapola – 15/16.05.2013



පුත්තලම, කුරුණෑගල දිස්ත්‍රික්ක වල පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩලයට පැවැත්වූ වැඩමුළුව වයඹ පළාත් කළමනාකරණ පුහුණු ආයතනය - වාරියපොල 2013.05.15/16

புத்தளம், குருணாகல் மாவட்டங்களில் பாராளுமன்ற உறுப்பினர்களின் பதவியணிக்கு நடத்தப்பட்ட செயலமர்வு, வடமேல் மாகாண முகாமைத்துவப் பயிற்சி நிறுவனம், வாரியபொல - 2013.05.15/16

Workshop Conducted for Parliamentarians staff of Puttalam & Kurunegala Districts– North Western Province Management Training Institute at Wariyapola – 15/16.05.2013



අනුරාධපුර, පොළොන්නරුව, බදුල්ල, කළුතර දිස්ත්‍රික්ක වල හා පෙර වැඩසටහන් වලට සහභාගී නොවුණු රියැදුරන් සඳහා පුහුණු වැඩමුළුව - ඉදිකිරීම් හා යන්ත්‍රෝපකරණ පුහුණු ආයතනය පැලවත්ත 2013.06.18

அனுராதபுரம், பொலனறுவை, பதுளை, களுத்துறை மாவட்டங்களின் மற்றும் முன்னைய நிகழ்ச்சித்திட்டங்களில் கலந்துகொள்ளாத சாரதிகளுக்கான பயிற்சிச் செயலமர்வு - நிர்மாணிப்பு, இயந்திர உபகரணங்கள் பயிற்சி நிறுவனம், பெலவத்தை - 2013.06.18

Workshop Conducted for Drivers of Anuradhapura, Polonnaruwa, Badulla & Kalutara Districts and for Who did not Attend Previous programmes - Training Institute of Construction and Machinery at Pelawatta – 18.06.2013



රත්නපුර, කෑගල්ල දිස්ත්‍රික්ක වල ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා පාර්ලිමේන්තු කාරක සභා අණපනත් වැඩමුළුව - සී/ස රත්නපුර දිස්ත්‍රික් සමූපකාර ග්‍රාමීය බැංකු සංගම් ශ්‍රවණාගාරය, නව නගරය රත්නපුර - 2013.09.24

இரத்தினபுரி, கேகாலை மாவட்டங்களின் பிரதேச செயலாளர்களுக்கான பாராளுமன்றக் குழுக்கள் மற்றும் கட்டளைச் சட்டங்கள் பற்றிய செயலமர்வு - வ.்.ப இரத்தினபுரி மாவட்ட கூட்டுறவு கிராமிய வங்கிச் சங்க கேட்போர்கூடம், புதிய நகரம் இரத்தினபுரி - 2013.09.24

Workshop on Parliamentary Committee Enactments for Divisional secetaries of Rathnapura & Kagalle Districts at the Auditorium of the Rathnapura District Cooperative Rural Bank Society Ltd. – 24.09.2013





යහපාලනය ග්‍රන්ථයේ දෙමළ භාෂා පරිවර්තනය එළි දැක්වීම - ත්‍රිකුණාමලය දිස්ත්‍රික් ලේකම් කාර්යාල ශ්‍රවණාගාරය - 2013.12.04

நல்லாட்சி பற்றிய நூல் தமிழ் மொழிபெயர்ப்பு வெளியீடு - திருகோணமலை மாவட்ட செயலகம் கேட்போர்கூடம் - 2013.12.04


Launching the Good Governance Book “Tamil Version” - at the Auditorium of the District secretariat office, Trincomalee



ත්‍රිකුණාමලය, දිගාමඩුල්ල, මඩකලපුව දිස්ත්‍රික්ක වල පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩලය සඳහා පැවැත්වූ වැඩමුළුව - කළමනාකරණ සංවර්ධන පුහුණු දෙපාර්තමේන්තුව - උප්පුවේලි, ත්‍රිකුණාමලය - 2013.12.04/05

திருகோணமலை, திகாமடுல்ல, மட்டக்களப்பு மாவட்ட பாராளுமன்ற உறுப்பினர்களின் பதவியணிக்காக நடத்தப்பட்ட செயலமர்வு - முகாமைத்துவ அபிவிருத்திப் பயிற்சித் திணைக்களம் - உப்புவேலி, திருகோணமலை - 2013.12.04.∴05

Workshop Conducted for Parliamentarians staff of Trincomalee, Digamadulla & Batticaloa Districts– Management Training Institute at Uppuweli, Trincomalee – 04/05.12.2013



පුත්තලම, කුරුණෑගල දිස්ත්‍රික්ක වල පාර්ලිමේන්තු මන්ත්‍රී කාර්ය මණ්ඩල සඳහා පැවැත්වූ වැඩමුළුව - වයඹ පළාත් කළමනාකරණ පුහුණු ආයතනය, වාරියපොල - 2013.05.15/16

புத்தளம், குருணாகல் மாவட்ட பாராளுமன்ற உறுப்பினர்களின் பதவியணிக்காக நடத்தப்பட்ட செயலமர்வு - வடமேல் மாகாண முகாமைத்துவப் பயிற்சி நிறுவனம், வாரியபொல - 2013.05.15.∴16

Workshop Conducted for Parliamentarians staff of Puttalam & Kurunegala Districts– North Western Province Management Training Institute at Wariyapola – 15/16.05.2013